# කුට්ටම් පොකුණ



බහුවාර්ගික රටක් වන ඔස්ට්‍රේලියාවේ සිංහල භාෂාව ප්‍රවර්ධනය වෙනුවෙන් කැපකල ලේඛකයෙක් වේ නම්, පත්තර කාරයෙක් වේනම් ජගත් එදිරිසිංහ එහි මුලට සිටිය යුතුය. ඔහු මෙරට තුල ඇගයීමට ලක්කල යුතු සිංහල පත්තර කාරයෙකි. ඒ ඔහු මෙරට සිටින සිංහල වුවද සිංහල අකුරු නොකියවන මිනිසුන්ට සිංහල පත්තර කියවන්නට ඉගැන්වූ නිසාය. විශාල ලේඛක පිරිසක් පත්තර තුලින් බිහිකල නිසාය. අද බොහෝ සිංහල මිනිසුන් අතේ පහන, සන්නස පත්තර තිබෙයි. මොවුන් ඒවා කියවයි. නමුත් මෙවැනි දෙයක් කරන්නට කොතරම් කාලයක් ධනයක් ශ්‍රමයක් කැප කල යුතුදැයි ඔවුන් නොදනීයි. ජගත් වැනි පත්තරකාරයෙක් ගැන ඔවුන් දැනගත යුත්තේ ඒ නිසයි.

# ජගත් සහ මම

මෙවර කුට්ටම් පොකුණේ මාතෘකාව වෙනත් ආරක් ගත්තේ මෙතෙක් කල් අපෙත් එක්ක ආ පත්තරකාරයෙක් නිසාය. ඔස්ට්‍රේලියාවේ මුලින් සිංහල පත්තර තිබුනේ නැත. සිංහල මිනිසුන් සිංහල වුනත් ජීවත් වුනේ ඔසියන් ලෙසය. නමුත් සිංහල සංක්‍රමනිකයන්ගේ පැමිණීම වැඩිවීම හේතුකොට ගෙන සිංහලයන්ට සිංහලකම දැනෙන්නට විය. ගුවන් විදුලි සිංහල වැඩසටහන් හා සමිති සමාගම් මේ අසුරෙන් බිහිවෙන්නට විය. ඒත් සිංහලයන්ට මෙරට තුල සිංහල පත්‍රයක් තිබුනේ නැත. ලංකාවේ මුද්‍රණය කරන සිංහල පත්තර කියවීමට සිටි පාඨකයන්ට මෙරට අත්දැකීම් බෙදාහදා ගැනීමට පත්තරයක ඇති වටිනාකම තදින් දැණුනු අවධියක "සිත්තර උණ" ඇති පත්තරකාරයෙකු අපිට හමුවිය. ඒ ජගත් ජේ. එදිරිසිංහය. නමුත් ජගත් අපිට මුලින් හමුවුනේ අපේ තොරතුරු ඉංග්‍රීසියෙන් යන පත්තරයකය. ඒ සෙරන්ඩිබ් නිව්ස් පත්තරයයි. එහෙත් එම පත්‍රයේ සිංහල සඳහා පිටු දෙකක් වෙන් කර තිබුණි. ඒ පිටු දෙක සංස්කරනය කරමින් සියලු තාඩන පීඩන මැද මෙරට ලේඛකයන්ට අතහිත දුන්නේ ජගත්ය. ආධුනික ප්‍රවීන අඩ්කෝදුව අතට නොගත් ජගත් නිසා ඉතා දක්ෂ ලේඛක පිරිසක් ඒ අසුරෙන් බිහිවිය. මාගේ මෙරටදී නිර්මාණය කල මුල්ම කවි නිර්මාණය සෙරන්ඩිබ් හි පළකළ ජගත් මා දිරිමත් කරමින් තව තවත් නිර්මාණකරණයට මා යොමු කරවීය. ඊටපසු "ජීවන මේලාව" නැමැති මාගේ කෙටි කතාවක් ද පළකල අතර, අතුල කල්දෙමුල්ල ඇතුළු මාවැනි නිර්මාණකරුවන්ගේ නිර්මාණ ඔස්ට්‍රේලියාව පුරා විසිරී සිටින පාඨකයන් අතට පත්කරවීය. මා එයින් ලද පන්නරය කෙසේද කියතොත් මාගේ කවි, කෙටිකථා ශ්‍රී ලංකාවේ ලක්බිම, දිවයින පත්තරවල ද පළවේ.

ඊටපසු සෙරන්ඩිබ් පුවත්පතෙන් සමුගත් ජගත්, අපේම කියා සිංහල පත්‍රයක් පටන් ගැනීමට සිය කාලය ධනය ශ්‍රමය වැය කරවීය. ඒ "පහනයි" පහනේ කට්ටියට සිඩ්නිවලින් මට ආරාධනා කල ජගත්, පහනේ එලිය වැඩිකිරීමට නොනිදා රැය පහන් කරමින් තම ජීවිතය කැප කලේය. නවතම ආරක් ගත් පහන පුවත් පත තුලින් ඉතාමත් දක්ෂ කවියක් ලේඛකයන් බිහිවූ අතර, එම ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ පහන තුලින් අදටත් අපට දැකගත හැක. තමන් දරදිය ඇද නිර්මාණය කල පහනෙත් අවාසනාවකට මෙන් ජගත්ට සමු ගැනීමට සිදුවූයේ එම පුවත්පත ඉතාමත් ඉහල තලයක තිබෙන විටය. ලාභ ඉපයීමට වඩා නිර්මාණවලට පත්තර තුලින් ලේඛකයන්ට තැනක් දුන් ඔහු, පත්තර කලාව කුමක්ද යන්න හොඳින් අධ්‍යනය කරගෙන සිටි පත්තරකාරයෙකි.

පහනෙන් සමුගත් ජගත්, ඊ ළඟට අත තිබ්බේ සන්නසටය. ඒ ඔහු හොඳ උණක් ඇති පත්තරකාරයෙක් නිසාය. වසර 7ක පමණ කාල පරාසයක් තුල මගේ නිර්මාණවලට තැනක් දුන් ජගත් සන්නසටද මට ආරාධනා කලේය. සන්නසේ කුට්ටම් පොකුණ බිහිවූයේ ඒ අනුවය. "ඇයි ලක්ෂමන් කුට්ටම් පොකුණ කියල නම දැම්මේ" ජගත් මගෙන් ඇසුවේය. "රජකාලේ කුට්ටම් පොකුණ හරි ලස්සනයි වතුර පිරිසිඳුයි" නමුත් අද කුට්ටම් පොකුණ ලඟට යන්න එය ජරාවාස වෙලා වතුර පල්වෙලා, අපේ රටට වෙලා තියෙන දේ ඒ තුලින් කදිමට නිරූපනය වෙනවා. මම කිව්වෙමි. එදා සිට අද දක්වා සන්නසේ කුට්ටම් පොකුණ පලවෙයි. සෑම මසකම මට ඇමතුමක් දී කුට්ටම් පොකුණ ලියන ලෙස අරයුම් කරන ජගත්, සන්නස සංස්කාරක ධුරයෙන් සමුගත්තද මට කිව්වේ දිගටම කුට්ටම් පොකුණ ලියන ලෙසය. වෙළඳ ආර්ථිකයක් තුල මුදලට මිස අවසන් පත්තරවලට ජයගත නොහැක. අද ලංකාවේ මෙන්ම මෙරටද පත්තර කලාව ධනවාදී ආර්ථික රාමුව තුල වෙළඳාම හා මුදලාලිකරණයට හසුවී ඇත. ඒ විශාල තලමසුන් හමුවේ අපි හාල්මැස්සන් වී ඇත.

නමුත් මට කුට්ටම් පොකුණ තුලින් එක දෙයක් කිව හැක. එයනම් බහුවාර්ගික රටක් වන ඔස්ට්‍රේලියාවේ සිංහල භාෂාව ප්‍රවර්ධනය වෙනුවෙන් කැපකල ලේඛකයෙක් වේ නම්, පත්තර කාරයෙක් වේනම් ජගත් එදිරිසිංහ එහි මුලට සිටිය යුතුය. ඔහු මෙරට තුල ඇගයීමට ලක්කල යුතු සිංහල පත්තර කාරයෙකි. ඒ ඔහු මෙරට සිටින සිංහල වුවද සිංහල අකුරු නොකියවන මිනිසුන්ට සිංහල පත්තර කියවන්නට ඉගැන්වූ නිසාය. විශාල ලේඛක පිරිසක් පත්තර තුලින් බිහිකල නිසාය. අද බොහෝ සිංහල මිනිසුන් අතේ පහන, සන්නස පත්තර තිබෙයි. මොවුන් ඒවා කියවයි. නමුත් මෙවැනි දෙයක් කරන්නට කොතරම් කාලයක් ධනයක් ශ්‍රමයක් කැප කල යුතුදැයි ඔවුන් නොදනීයි. ජගත් වැනි පත්තරකාරයෙක් ගැන ඔවුන් දැනගත යුත්තේ ඒ නිසයි.

ජගත්ගේ සමුගැන්ම තුලින් මට මතක්වෙන්නේ ජාතක කථා සංග්‍රහයේ එන මහා සුදර්ශන ජාතකයයි. ඒ තුලින් කදිම උපදේශයක් අප සැමට ලබදේ. එයනම් ප්‍රඥාවන්තයෙක් අනියත ලෝක ස්වභාවය ගැන කම්පා නොවෙති. ශෝක නොකරති යන්නයි.

ලක්ෂමන් කොඩිතුවක්කු

**Expert Maths / Science Tuition**

**VCE / International Bacc. Exams.**
**Maths Methods , Specialist Maths , Further Maths**

**Mathematics from Year 5 to Year 10**

**Private Schools Scholarship Examinations**

**Conducted by a Registered Trained Graduate - School Teacher** holding the Postgraduate Certificate of Education in Mathematics & ScienceTeaching – Masters Program (Monash Uni ), who is experienced in Victorian Secondary Colleges & the Curriculum and has produced Excellent Results.

**Results Guaranteed !!** **Reasonable Rates**

**Contact: Rasi Phone: ( 03 ) 95439231**
**Mobile : 0423314459**

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

Sannasa

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760